**ශීර්ෂය - 412 විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 අගෝස්තු 05 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2021 දෙසැම්බර් 31 දිනට විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍යකාර්යය සාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණන කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකිම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු 1.6.1 (අ) ඡේදයෙහි සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසැඳුම් ප්‍රකාශය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අත්තිකාරම් බී ගිණුමෙහි කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ පැවති රු. 128,028 ක හඳුනා නොගත් බැර ශේෂයක් ගැලපීමෙන් පසු සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර මුද්‍රිත සටහන් අනුව අත්තිකාරම් බී ගිණුමේ ශේෂය ලෙස රු. 65,014,795 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම නොසැසඳුනු ශේෂය සම්බන්ධයෙන් 2022 වර්ෂයේ දී මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීමට අවධානය යොමු කර ඇති බව. | භාණ්ඩාගාර මුද්‍රිත සටහන් වල ශේෂය අනුව අමාත්‍යාංශ ගිණුම් වල පවතින මෙම වෙනසට හේතුව පරීක්ෂා කර අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතුවීම. |

### 1.6.2 මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය (ACA 6) අනුව ශේෂය රු. 308,366,697 ක් වුවද එය 2021 ජනවාරි 01 දිනට රු. 308,479,016 ක් ලෙස භාණ්ඩාගාරයේ සමුච්චිත මූල්‍ය නොවන වත්කම් පිළිබද (SA 82) වාර්තාවෙන් ඉදිරියට ගෙනවිත් තිබුණි. මෙම වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල සටහන් මඟින් හෙළිදරව් කර නොතිබුණි. | 2020 වර්ෂයේ දී ඉදිරිපත් කරන ලද (ACA 6) වාර්තාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් වල සත්‍ය ශේෂය වනුයේ රු. 308,479,016 කි. ඒ අනුව 2021 වර්ෂයේ දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් ශේෂයන් නිවැරදි අගයන් බව සඳහන් කරමි. | පෙර වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල ශේෂයන් ඉදිරියට ගෙන ඒමේදී වෙනසක් සිදුවී තිබුණි නම් එම වෙනසට හේතුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවීම. |

### 1.6.3 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ පවත්නා අභ්‍යන්තර පාලන පද්ධතිය ක්‍රමවත් වැඩපිළිවෙළක් යටතේ ක්‍රියාත්මක වනු ඇත. මේ සම්බන්ධව මා විසින් පවත්වනු ලබන මාණ්ඩලික නිලධාරීන්ගේ රැස්වීම්වල දී විශේෂ අවධානයක් යොමුකර අවශ්‍ය වන්නාවූ අදාල ක්‍රියාමාර්ගයන් ගනු ලබන බව. | ජාතික විගණන පනතෙහි නිර්දේශයන්ට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවත්, වාර්තාවේ 4.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | අමාත්‍යාංශය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයකු අනුයුක්ත කර ගැනීමට කිහිප අවස්ථාවකදීම කටයුතු කරනු ලැබුවත්, මේ වන තෙක් නොහැකි වී ඇත. ඒ අනුව නියමිත පරිදි අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇති බව. | අභ්‍යන්තර විගණන ඒකකයක් ආරම්භ කර එම ඒකකය වඩාත් ඵලදායීව පවත්වාගෙන යායුතු වීම. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 අග්‍රිම කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ වියදම් වෙනුවෙන් රු. මිලියන 169.97 ක අග්‍රිමයක් ලබා ගැනීමට සැලසුම් කර තිබුණු අතර වර්ෂය තුල අග්‍රිම ඉල්ලුම් කිරීම්වල එකතුව රු. මිලියන 193.65 ක් වී තිබුණි. සැලසුම් කළ අග්‍රිමයෙන් සහ ඉල්ලුම් කළ අග්‍රිමයෙන් පිළිවෙලින් | සෑම මසකම අපේක්ෂිත එක් එක් වියදම් සැලකිල්ලට ගෙන අග්‍රිම ඉල්ලුම් කිරීම සිදුකරනු ලබයි. භාණ්ඩාගාරයෙන් නියමිත පරිදි මුදල් නොලැබීම හේතුවෙන් මෙලෙස ඊළඟ මාසයේදී එම වියදම් සඳහා නැවත අග්‍රිම ඉල්ලුම් කිරීමට සිදුවනු ඇත. ඒ අනුව අග්‍රිම | වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් නියමිත කාලය තුල නිමකිරීම සඳහා අග්‍රිම කළමනාකරණය නිසි ලෙස පවත්වාගෙන යා |

| | | |
|---|---|---|
| සියයට 77 ක් සහ සියයට 68 ක් පමණක් අමාත්‍යාංශය වෙත ලැබී තිබුණි. වාර්ෂික ඇස්තමේන්තු ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කිරීමට සැලසුම්කළ වැඩසටහන් නියමිත කාලයතුල නිමකිරීමට මෙම තත්ත්වය බාධාවක් වී තිබුණි. | සීමාවන් ට වඩා අග්‍රිම ඉල්ලුම් කිරීම සංඛ්‍යාත්මකව වැඩි අගයක් පෙන්නුම් කරන බව. | යුතුවීම. |

## 2.2 වියදම් කළමනාකරණය

-------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2015 දෙසැම්බර් 29 දිනැති අංක 07/2015 දරන අයවැය චක්‍රලේඛයෙහි 02 වන ඡේදයෙහි හා මුදල් රෙගුලාසි 05 හි දක්වා ඇති නිර්දේශයන්ට අනුකූල නොවන පරිදි සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 08 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයට අමතරව මුදල් රෙගුලාසි 66 යටතේ රු. 6,530,500 ක් වෙනත් අරමුණු සඳහා වෙන්කළ ප්‍රතිපාදන මාරු කර තිබුණි. වැය විෂයයන් අතර එලෙස මාරුකිරීමේ ප්‍රතිශතය සියයට 23 සිට සියයට 92 අතර පරාසයක් ගෙන තිබුණි. | භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ප්‍රමාණවත් පරිදි නොලැබීම හේතුවෙන් අත්‍යවශ්‍ය වියදම් සඳහා වෙනත් වැය විෂයයන් වල පවත්නා ඉතිරි වීම් තුළින් ප්‍රතිපාදන මාරු කරගෙන ඇති බව. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙළ කර, සලසා ඇති ප්‍රතිපාදන සීමාවන් තුළම වියදම් කළමණාකරණය කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 09 ක රු. 32,770,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 12,270,173 ක් හෙවත් සියයට 37 ක් සහ ප්‍රාග්ධන වැය විෂයයන් 05 ක රු. 10,500,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 7,610,316 ක් හෙවත් සියයට 72 ක් ඉතිරි වී තිබුණි. | 2021 වර්ෂයෙහි ප්‍රාග්ධන වියදම් වැය කිරීම් සම්බන්ධයෙන් ගන්නා ලද අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි ප්‍රාග්ධන වියදම් දැරීම් සීමා කිරීමට කටයුතු කර ඇති බව. | අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන පූර්ව සැලසුම් සකස් කර ප්‍රතිපාදන වෙන් කර ගැනීම සහ මනා කළමනාකරණයකින් යුක්තව ප්‍රතිපාදන වැය කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

--------------------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව එකතුව රු. 98,442 ක් වූ බැරකම් හා බැඳීම් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් කර නොතිබුණි. | 2021 වර්ෂයට අදාළව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම 2022 පෙබරවාරි 12 දින වන විට අවසන් කරන ලදී. එම දිනට පසුව ඉදිරිපත් වූ ගෙවීම් වලට අදාල බැරකම් මෙලෙස බැරකම් ලේඛනයට ඇතුළත් කිරීමට නොහැකි වී ඇති බව. | වර්ෂයට අදාළ වියදම් පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුලත් කර මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමට කටයුතු කළ යුතුවීම. |

## 2.4 අවිධිමත් ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| තාක්ෂණික නිර්ණායකයන්ට අනුකූල නොවූ ලිපිගොනු කබඩ් 08 ක් 2019 වර්ෂයේදී රු. 759,687 කට මිලදීගෙන අමාත්‍යාංශ පරිහරණයට ගෙන තිබුණි. ප්‍රතික්ෂේප කළ හැකිව තිබූ එම භාණ්ඩ නිසි පරීක්ෂාවකින් තොරව භාවිතයට ගෙන තිබුණු අතර ඒවායේ පැවති දිග සහ පළලෙහි වෙනස්කම් සඳහා පිරිවැයෙන් රු. 58,438 ක් අඩුකර අමාත්‍යාංශයේ ගණකාධිකාරීගේ නිර්දේශ මත 2021 වර්ෂයේදී ගෙවීම් සිදුකර තිබුණි.. | ක්‍රීඩා අමාත්‍යාංශයේ තාක්ෂණික නිලධාරියාගේ සහතිකය මත මෙම කබඩ් අමාත්‍යාංශ පරිහරණයට ගෙන ඇති අතර එම වර්ෂය තුල මුල්‍ය ප්‍රතිපාදන නොමැති වීම මත ගෙවීම් කර නොතිබුණි. අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය යටතේ එම කබඩ් නැවත පරීක්ෂා කර පසුව ගෙවීම් සිදු කර ඇති බව. | තාක්ෂණික පිරිවිතර පරීක්ෂා කිරීමකින් තොරව භාණ්ඩ භාර ගැනීම සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |

## 2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(4) ප්‍රකාරව නිශ්චිත හා අවශ්‍ය නොවන කාර්යයන් සඳහා අතුරු අග්‍රිම ගණන්දීමේ නිලධාරියා විසින් වුවද ලබා නොගත යුතු වුවත්, අමාත්‍යාංශයේ ලේකම් විසින් 2021 වර්ෂයේදී අවස්ථා 05කදී ලබාගෙන තිබූ එකතුව රු. 57,896 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම මුදල් දින 03 සිට දින 54 ක් අතර කාල පරාසයක් නිශ්කාර්යව අත රඳවා තබාගෙන නැවත පියවා තිබුණි. | අත්තිකාරම් පියවීම් සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | අතුරු අග්‍රිම ලබාදීම සහ පියවීම චක්‍රලේඛ උපදෙස්වලට අනුව සිදුකළ යුතුවීම. |
| (ආ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 1/2020 චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5) ප්‍රකාරව කාර්යය නිමකර දින 10 ක් ඇතුලත තත්කාර්යය අතුරු අග්‍රිමය අදාල බිල්පත් මඟින් නිරවුල් කළ යුතු වුවත්, අවස්ථා 10 කදී ලබාදී තිබුණු එකතුව රු. 140,917 ක් වූ තත්කාර්යය අතුරු අග්‍රිම කාර්යය නිම වී දින 14 සිට දින 58 ක් දක්වා කාලපරාසයක ප්‍රමාදයකින් පසුව නිරවුල් කර තිබුණි. | අත්තිකාරම් පියවීම් සම්බන්ධයෙන් වූ චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | මුදල් රෙගුලාසි වලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |

## 2.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 105 | අමාත්‍යාංශයට අයත් රථයක් සමාලෝචිත වර්ෂයේ අනතුරකට ලක්වීමෙන් අලුත්වැඩියාව සඳහා දරන ලද මුදලින් රක්ෂණය මඟින් ආවරණය නොවූ රු. 40,842 ක පාඩුව රජයට අයකර ගැනීම සඳහා මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කඩිනමින් කටයුතු කරන බව. | නිලධාරීන්ගේ නොසැලකිලිමත්කම හේතුවෙන් රජයට සිදුවී ඇති මෙම පාඩු අදාළ වගකිවයුතු අයගෙන් ආවරණය කර ගැනීමට කටයුතු කළ යුතුවීම. |
| (ආ) | 2019 ජූනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයෙහි 02 ඡේදය හා 2019 දෙසැම්බර් 04 දිනැති අංක 07/2009 දරන මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ චක්‍රලේඛය | මෙම චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව අමාත්‍යාංශ ලේකම් ඇතුලුව නිලධාරීන් 05 දෙනෙකු විසින්, කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් ලබාගෙන ගමන් කළ හැකිව තිබූ වැඩසටහන් වෙනුවෙන් 2021 වර්ෂයේ අවස්ථා 10 කදී රියදුරු අතිකාල සහ සංයුක්ත දීමනාවලට අමතරව අතිරේඛ ඉන්ධන සහ අධිවේගී මාර්ග ගාස්තු වෙනුවෙන් රු.186,144 ක් වැයකර තිබුණි. | එවකට රටෙහි පැවති වසංගත තත්වය, නිලධාරීන් පදිංචි ස්ථානය සහ රැස්වීම් පැවති ස්ථාන ආදිය සැලකීමේදී නිලධාරීන් සියලු දෙනා එක වාහනයක ගමන් කිරීම ප්‍රායෝගික නොවූ බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| (ඇ) | 2009 අප්‍රේල් 06 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛයේ 02 IV ඡේදය | චක්‍රලේඛ විධිවිධානයන්ට පටහැනිව අමාත්‍යාංශ ලේකම් ඇතුළු නිලධාරීන් 03දෙනෙකු වෙත 2021 වර්ෂයේ මාස 03 ක් තුල ඇඟිලි සලකුණු යන්ත්‍ර මඟින් පැමිණීම සනාථ කරගැනීමකින් තොරව අතිකාල හා නිවාඩු දින වැටුප් ලෙස එකතුව රු. 79,837 ක් ගෙවා තිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | 2021 වර්ෂයේ කොවිඩ් රෝගය බහුල ලෙස ව්‍යාප්ත වී තිබූ බැවින් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා කිරීමෙන් වැළකී සිටි අතර ඒ වෙනුවට අත්සන් ලේඛනයක් නඩත්තු කිරීම අනිවාර්යය කරන ලදී. ඒ මත පදනම්ව මෙම ගෙවීම් සිදුකර ඇති බව. | මේ සම්බන්ධයෙන් පෙර වර්ෂ විගණන වාර්තා මඟින්ද කරුණු දක්වා තිබුණද ඒ පිළිබඳ අවධානය යොමු නොකිරීම පිළිබඳව කළමණාකරණයේ විශේෂ අවධානය යොමුවිය යුතුවීම. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 900,000 ක් වැය කරමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කළ වැඩසටහන් 04 ක් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණු අතර සැලසුම් කළ තවත් වැඩසටහන් 05 ක නිමකිරීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු මට්ටමක පැවතුණි. | මෙම වැඩසටහන් වල ඇතුලත් වී ඇති ක්‍රියාකාරකම් ක්ෂේත්‍රයේ සිදුකළ යුතු කාරණා බැවින් පැවතුනු කොවිඩ් වසංගත තත්ත්වය යටතේ ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ බව හා ප්‍රාග්ධන ප්‍රතිපාදන සීමා කිරීම්ද එක් හේතුවක් වූ බව. | පවතින ආර්ථික සහ දේශපාලන පරිසරය පිළිබඳව අවබෝධයකින් යුතුව වැඩසටහන් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවීම. |

### 3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| විගමණික ශ්‍රමිකයන්ගේ පවුල් පැතිකඩවලට අදාල තොරතුරු පරිගණකගත කර දත්ත පද්ධතියක් පවත්වා ගැනීමට සහ යාවත්කාලීන කරන ලද තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට මාර්ගගත (Online) පරිගණක පද්ධතියක් මඟින් එවීම අරමුණු කරගෙන අමාත්‍යාංශය විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා 2016 හා 2017 වර්ෂවල පරිගණක 277 ක් රු. 35,500,959 ක් වැය කර මිලදීගෙන බෙදා හැර තිබුණි. එහෙත් අපේක්ෂිත පරිදි දත්ත පද්ධති නඩත්තු කර අවශ්‍ය තොරතුරු ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට යොමු කිරීමට විගණන දිනය වූ 2022 අප්‍රේල් 05 වන විටත් නොහැකි වී තිබුණි. | දත්ත පද්ධතියක් නිර්මාණය කිරීම සහ සංවර්ධනය කිරීම සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර ඒ සඳහා යම් කාලයක් ගතවේ. දැනට පවතින ගැටලු හඳුනාගෙන ඊට අදාල ඉදිරි ක්‍රියාමාර්ග ගනිමින් පවතින බව හා අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගත හැකි වන්නේ එම පද්ධතිය නිසිපරිදි ක්‍රියාත්මක කළ පසුව වන බව. | වැඩසටහන ආරම්භ කිරීමේ අරමුණ, පරමාර්ථය හා ප්‍රථිඵල ලඟාකරගැනීමට ඇති හැකියාව පිළිබඳ ප්‍රායෝගික තත්ත්වය සැලකිල්ලට ගෙන වැඩසටහන ආරම්භ කළ යුතුවීම. තවද මිලදීගත් පරිගණක කාර්යක්ෂමව උපයෝජනය කිරීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

### 3.1.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව පිළියෙල කළ | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ |

| | | |
|---|---|---|
| යුතුව තිබූ කාර්යයසාධන වාර්තාවෙහි, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සම්බන්ධයෙන් වූ පරිච්ඡේදයෙහි ඇතුලත් කාර්යාංශයේ සංවිධාන ව්‍යුහයෙහි, එහි අනුමත කාර්යය මණ්ඩලයට ඇතුලත් නොවූ අධ්‍යක්ෂ පරිපාලන තනතුරක් සඳහා විධිමත් පත්වීමකින් තොරව නිලධාරියකු බඳවාගෙන තිබුණි. | පරිපාලන තනතුරට අදාල පත්කිරීම් නිවැරදි කිරීමට කටයුතු කරන ලෙස අමාත්‍යාංශය විසින් අවස්ථා කිහිපයකදී ලිඛිතව දන්වා ඇති බව. එම තනතුර කාර්යසාධන වාර්තාවේ දැක්වීමේදී නිවැරදි කර ඉදිරිපත් කරන ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශය වෙත දැන්වීමට කටයුතු කර ඇති බව. | පරිපාලන විධිමත්භාවය පවත්වා ගැනීමට විෂයභාර අමාත්‍යාංශයේ ක්‍රියාකාරී මැදිහත්වීම අවශ්‍ය බැවින් ඒ පිළිබඳ කළමණාකරණයේ අවධානය යොමුවිය යුතුවීම. |

### 3.2 රජයේ නිලධාරීන් ඇප තැබීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ නිලධාරීන් ඇප තැබීම පිළිබඳව 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයෙන් සංශෝධිත මු.රෙ.880 අනුව රජයේ මුදල් ආදියෙහි භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින් නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළයුතු යැයි මු.රෙ. 315 හි සඳහන් කර තිබුණද ඇප තැන්පත් කළ යුතු, ගණකාධිකාරී, මුදල් අයකැමි, ගබඩාභාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාල ඇපමුදල් තැන්පත් කර නොතිබුණි. | ප්‍රධාන ගණකාධිකාරි විසින් මේ වනවිටත් ඇප තැන්පත් කර ඇති බව. | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූලව ඇප තැන්පත් කළ යුතු නිලධාරීන් අදාල ඇප මුදල් තැන්පත් කිරීමට කටයුතු කළ යුතුවීම. |

### 3.3 අනාර්ථික ගනුදෙනු

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශ කාර්යාලය සඳහා ගොඩනැගිලි කුලියට ගැනීම වෙනුවෙන් 2016 ජනවාරි සිට 2019 ඔක්තෝබර් දක්වා අවස්ථා දෙකකදී එකතුව රු.95,628,000 ක කුලියක් ද එම අවස්ථා දෙකේදී කුලියට ගත් ගොඩනැගිලිවල කාමර වෙන් කිරීම සහ බඩු ප්‍රවාහනය සඳහා එකතුව රු. 15,417,121 ක්ද වැය කර තිබුණි. එමෙන්ම 2019 වර්ෂයේ සිට නැවත නාරාහේන්පිට පිහිටි මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි කාර්යාලය ස්ථාපිත කිරීමට තීරණය කර එහි කාමර වෙන් කිරීම් වෙනුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ රු. 34,614,934 ක ඇස්තමේන්තුව මත 2021 | මෙම අමාත්‍යාංශය 2022 මැයි මස වන විට නාරාහේන්පිට මෙහෙවර පියස ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | අමාත්‍යාංශය කාර්යාලය සඳහා දිගින් දිගටම බාහිර ගොඩනැගිලි කුලියට ගෙන ඒවායෙහි වැඩිදියුණු කිරීම් සහ කාමර වෙන් කිරීම් සඳහා රජයේ මුදල් ඵලදායී නොවන ලෙස වැය කිරීම ගැටලුවක් බැවින් රජයේ ස්ථිර ගොඩනැගිල්ලක අමාත්‍යාංශ කාර්යාලය පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු කළ යුතුවීම. |

වර්ෂයේදී රු. 2,000,000 ක මූලික ගෙවීමක් සිදුකර තිබුණි. අමාත්‍යාංශ ගොඩනැගිල්ල නිශ්චිත ස්ථානයක පවත්වා නොගැනීම හේතුවෙන් කාමර වෙන්කිරීම හා ප්‍රවාහනය වෙනුවෙන් අමතර මුදල් වැය කිරීමට සිදු වී තිබුණි.

## 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කොරියාවෙහි රැකියා සඳහා ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් යොමු කිරීමට අදාලව විදේශ රැකියා අමාත්‍යාංශය සහ කොරියානු රජය අතර 2017 නොවැම්බර් 29 දින වර්ෂ 02 ක කාලයකට අදාලව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි 03 ඡේදයට අනුව, සාධාරණ හේතුවක් නොමැතිව එම ගිවිසුම නැවත යාවත්කාලීන කිරීම සඳහා ගිවිසුම අවලංගුවී මාස 06 ක කාලයක් ඉකුත් වුවහොත්, ගිවිසුම අත්හිටුවීමට හෝ අවසන් කිරීමට හැකියාව පවතී.එහෙත් විගණන දිනය වූ 2022 මැයි 25 වන විට එම ගිවිසුමෙහි වලංගු කාලය වර්ෂ 2 ½ ක් ඉක්ම ගොස් ඇතත් යාවත්කාලීන කර නොතිබුණි. | අදාල පාර්ෂවයන්ගේ සංශෝධන හා අනුමැතීන් ඇතුලත් අවබෝධතා ගිවිසුමේ කෙටුම්පත කොරියානු රජයේ එකඟතාවය ලබා ගැනීම සඳහා 2022 මැයි 09 දින විදේශ කටයුතු අමාත්‍යාංශයට යොමු කර ඇති බව. | රාජ්‍යයන් දෙක අතර වූ මෙම ගිවිසුම මඟින්, දැනට වැඩිම සහ වඩාත් වාසිදායකම රැකියා අවස්ථාවන් සඳහා අඩු පිරිවැයක් යටතේ විදේශ රැකියා සඳහා යොමුවීමට ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ට ලැබී ඇති අවස්ථාව යාවත්කාලීන කර වර්ධනය කිරීමට කළමනාකරණයේ අවධානය යොමුවිය යුතු වීම. |
| (ආ) | කාර්මික අපනයන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයට හා කම්කරු අමාත්‍යාංශයට අයත් වාහන දෙකක් 2020 අගෝස්තු මාසයේ සිට විධිමත් පවරාගැනීමකින් තොරව විගණන දිනය වූ 2022 මැයි 05 දක්වා අමාත්‍යාංශයේ පරිහරණය සඳහා යොදවා ගෙන තිබුණි. | එම වාහන පවරාගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව. | විධිමත්ව පවරා ගෙන වෙනත් ආයතනවලට අයත් වත්කම් පරිහරණයට ගත යුතුවීම. |
| (ඇ) | 2015 සිට 2019 දක්වා කාලපරිච්ඡේදවල ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සිදුවී ඇති බවට සඳහන්ව තිබූ අක්‍රමිකතා සිද්ධීන් 07 කට අදාලව මූලික විමර්ෂණ සිදුකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් විමර්ෂණ නිලධාරීන් තිදෙනෙකු පත්කර ඊට අදාල වාර්තා ලබාගෙන තිබුණි. එහෙත් එම වාර්තා පදනම් කර ගෙන විධිමත් විනය පරීක්ෂණ පැවැත්වීමට හෝ වෙනත් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කර නොතිබුණි. | මූලික විමර්ෂණ වාර්තා අසම්පූර්ණ බැවින් අදාල ගෙවීම් නොකරන ලද අතර විමර්ෂණවලට අදාලව ඉදිරි ක්‍රියාමාර්ග කිසිවක් නොගන්නා ලද බව. | එම මූලික විමර්ෂණ වාර්තාවල පවතින අඩුපාඩු නිශ්චිතව සඳහන් කර, ගෙවීම් නතර කිරීමට හේතුව දක්වා නොතිබුණි. තවද අදාල සිද්ධීන් සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමුවිය යුතුය. |

## 4. යහපාලනය

### 4.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දීර්ඝ කාලයක සිට පුරප්පාඩුව පැවති අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණක තනතුර සඳහා 2019 වර්ෂයේ දෙසැම්බර් සිට කොන්ත්‍රාත් පදනමින් නිලධාරියකු පත්කර තිබුණු අතර 2020 දෙසැම්බර් 01 දිනට කොන්ත්‍රාත් කාලය නිමවීමෙන් පසු විධිමත් පත්වීමකින් තොරව එම නිලධාරියා 2021 සැප්තැම්බර් 19 දින දක්වා එම තනතුරෙහි කටයුතු කර සේවයෙන් ඉවත්ව ගොස් තිබුණි. එදින සිට විගණන දිනය වූ 2022 අප්‍රේල් දක්වා අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුවී නොතිබුණි. | අමාත්‍යාංශය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණක වරයකු මේ වන තෙක් අනුයුක්ත කර ගැනීමට කිහිප අවස්ථාවකදීම කටයුතු කරනු ලැබුවත් මේ වන තෙක් නොහැකි වී ඇත. ඒ අනුව නියමිත පරිදි අභ්‍යන්තර විගණන කාර්යයන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වී ඇත. | මූල්‍ය හා පරිපාලන කටයුතු විධිමත් ඇගයීමකට භාජනය වන පරිදි ශක්තිමත් අභ්‍යන්තර විගණන ඒකකයක් ආරම්භකර පවත්වාගෙන යා යුතුය. |

### 4.2 විගණන හා කළමනාකරණ කමිටුව

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01 – 2019 දරන විගණන හා කළමනාකරණ චක්‍රලේඛයෙහි 5.3 ඡේදය ප්‍රකාරව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම අවම වශයෙන් කාර්තුවකට වරක්, එනම් වර්ෂයකට 4 ක් වන පරිදි අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති සියළුම ආයතන ආවරණය කරමින් පැවැත්විය යුතු වුවත්, අමාත්‍යාංශය විසින් 2021 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් එකක් පමණක් පවත්වා තිබුණි. | අමාත්‍යාංශය සඳහා ස්ථිර අභ්‍යන්තර විගණකවරයකු අනුයුක්ත කර මෙම කටයුතු විධිමත් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර අමාත්‍යාංශයේ සහ ඒ යටතේ වූ ආයතනවල මූල්‍ය සහ පරිපාලන කටයුතු විධිමත්ව පවත්වාගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවීම. |